www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලාංකික කලාකරුවා, සිංහල අන්තවාදීන්ගෙන් තමාට එල්ල වී ඇති මරන තර්ජන පිලිබඳව කතා කරයි

## Sri Lankan artist speaks about death threats by Sinhala extremists

**පානිනී විජේසිරිවර්දන විසිනි**
**2003 දෙසැම්බර් 12**

*මෙහි පහත පල වන්නේ, සිංහල අන්තවාදීන් විසින් මෑත දී එල්ල කරන ලද මරන තර්ජන මාලාවකට මුහුන දී සිටින, ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලාංකික කලාකරුවකු වන ධර්මසිරි බන්ඩාරනායක සමග ලෝක සමාජවාදී වෙබ් අඩවිය කරන ලද සම්මුඛ සාකච්ඡාවකි. දිවයිනට සාමය උදා කර ලීමේ ලා පහසුකම් සපයන්නකු ලෙස කලාවට ක්‍රියා කල හැකි ය යන දැඩි විශ්වාසය හේතුවෙන් ඔහු මෙම තර්ජනවලට ඉලක්ක වී ඇත.*

*54 හැවිරිදි බන්ඩාරනායක, ඔහුගේ රංගනය, තිර රචනය සහ අධ්‍යක්ෂනය යනාදියෙන් සිනමා සහ වේදිකා නාට්‍ය යන ක්ෂේත්‍ර ද්වයෙන් ම පුලුල් ඇගයීමකට පාත්‍ර වූවෙකි. ඔහුගේ චිත්‍රපට ජාත්‍යන්තර සිනමා උලෙලවල දී තිරගත වී ඇති අතර කලා ක්ෂේත්‍රයේ ඔහුගේ ජයග්‍රහන අගය කරනු වස්, එක්සත් ජනපදයේ නිව් ඕර්ලින්ස් පුරවරය බන්ඩාරනායකට සම්මාන පුරවැසිභාවයක් ද පිරිනමන ලදි.*

*බන්ඩාරනායකට ඔහුගේ නිර්මාන සඳහා සම්මාන ගනනාවක් ම හිමි විය. එම සම්මාන අතරට පහත සඳහන් සම්මාන ද අන්තර්ගත ය; 1987 දී, ශ්‍රී ලංකාවේ චිත්‍රපට විචාරක සංගමය විසින්, ශ්‍රී ලංකාවේ හොඳම සිනමා අධ්‍යක්ෂවරුන් දස දෙනා (1947-1987) ගෙන් කෙනෙකු ලෙස බන්ඩාරනායක තෝරා ගෙන පුද කරන ලද සම්මානය, ජපාන-ශ්‍රී ලංකා මිත්‍රත්ව සංස්කෘතික අරමුදල මගින්, සිනමාවේ හා වේදිකාවේ අත් කර ගත් සුවිශේෂ සාර්ථකත්වයන් හේතුවෙන්, 1996 දී පුද කරන ලද "බුන්කා තිලිනය", ශ්‍රී ලාංකික වේදිකාවට හා සිනමාවට කරන ලද ප්‍රතිපදානය හේතුවෙන් 1996 දී කොලඹ විශ්ව විද්‍යාලය විසින් පිරි නමන ලද "ප්‍රසාද ප්‍රනාමය".*

*බන්ඩාරනායකගේ නවතම නිර්මානය වන ට්‍රෝජන් කාන්තාවෝ — යූරිපිඩිස්ගේ ග්‍රීක නාට්‍යය, ට්‍රෝජන් වුමන් හි සිංහල අනුවාදය — නාට්‍යය යුද්ධයෙන් ව්‍යසනයට පත් උතුරු හා නැගෙනහිර පලාත් ඇතුලුව දිවයින පුරා විවිධ ස්ථානයන්හි වේදිකා ගත වන අතර එය පුලුල් ප්‍රසාදයකට ද ලක් වෙමින් පවතී.*

*ලෝසවෙඅ*: මෑත දී ඔබට එල්ල වූ මරනීය තර්ජනවල පසුබිම කුමක් ද?

ධර්මසිරි බන්ඩාරනායක: මෙය, මෙවන් මරනීය තර්ජන මට එල්ල වූ ප්‍රථම අවස්ථාව නොවෙයි. වෙනස වන්නේ, මෙවර එය ප්‍රසිද්ධියේ ම එල්ල කිරීමයි. ඔක්තෝබර් 29 දින, කොලඹ නව නගර ශාලාවේ පැවැත්වූ සිංහල හා දෙමල කලා උලෙලේ දී තමයි මෙම තර්ජනය එල්ල කලේ. සංවිධායකයින් විසින් උලෙල අමතන ලෙස මට ඇරයුම් කලා. එය ඇරඹී වැඩි වේලාවක් යන්නට මත්තෙන්, මෙම උලෙල කොටි ත්‍රස්තවාදීන්ට (දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය) අනුබලය දෙන්නක් බවට ඝෝෂා කරමින්, එක්තරා ප්‍රකෝපකාරී කන්ඩායමක් ප්‍රේක්ෂකයන්ට කායිකව පහර දෙන්නට පටන් ගත්තා. මෙම ප්‍රකෝපකරනය හේතුවෙන් රැස්වීමේ වැඩ කටයුතු ඇනහිටි මොහොතේ, තවත් සන්නද්ධ මැර කන්ඩායමක් ශාලාවෙන් පිටත සිට ශාලා භූමියට ඇතුලුව සහභාගිවූවන්ට පහර දුන්නා. ඒ මොහොතේ දී මෙම මැරයන් මා ඉතා ඉක්මනින් ම මරා දමන බවට මොර දුන්නා. සිංහල කොටි ත්‍රස්තවාදියෙක් යැයි මට චෝදනා කල ඔවුන්, නොවැම්බර් 7, 8 හා 9 යන දිනයන්හි කොලඹ දී පවත්වන්නට නියමිතව තිබූ, ට්‍රිකෝන් කලා කේන්ද්‍රය හරහා මා විසින් ආරම්භකත්වයක් ලබා දුන්, සිංහල දෙමල නාට්‍ය උලෙල පවත්වන්නට ඉඩ නොදෙන බවට තර්ජනය කලා.

*ලෝසවෙඅ*: ඔබ සිතන අයුරු මෙම ප්‍රහාරය සංවිධානය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

ධ:බ: සිංහල, දෙමල කලා උලෙල පැවැත්වුනේ එයට එරෙහිව සිහල උරුමය පක්ෂය විසින් ගෙන යනු ලැබූ වෛරීසහගත උද්ඝෝෂනයක් මධ්‍යයේ. සිහල උරුමය සිංහල ස්වෝත්තමවාදී පක්ෂයක්. උලෙල පිලිබඳව නිවේදනය කල විට, උලෙලේ සංවිධායකයින් එල්ටීටීඊයට ආධාර කරන ත්‍රස්තවාදීන් පිරිසක් බවට චෝදනා කරමින් සිහල උරුමය මාධ්‍ය උද්ඝෝෂනයක් දියත් කලා. මේ සමගම, උලෙල කෙසේ හෝ වලක්වන බවට ස්වෝත්තමවාදී පූච්චානම් කතා ද කලා. මෙම උද්ඝෝෂනය තුල ප්‍රමුඛ භූමිකාව ඉටු කරනු ලැබුවේ

"උපාලි" ප්‍රකාශන සමාගමේ *දිවයින* පුවත්පත යි. මේ අනුව එදින ප්‍රහාරය පිටුපස සිටියේ කවුරුන් ද යන්න පැහැදිලි යි.

තවදුරටත් කියනව නම්, මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් කවර හෝ සබඳතාවක් නැතැයි ප්‍රකාශ කල සිහල උරුමය, ප්‍රහාරයට සම්බන්ධිත බවට සැක පිට පොලිස් රක්ෂිත බන්ධනාගාරයේ රඳවා සිටි සැකකරුවන් ඇප මත මුදා හල අවස්ථාවේ, ඔවුන් වීරයන් සේ පිලිගෙන ප්‍රසිද්ධ පෙරහැරකින් කැඳවා ගෙන ගොස් රැස්වීමක් ද පැවැත්වුවා.

*ලෝසවෙඅ:* මෙම පහරදීම සිදුවන මොහොතේ ඔබේ සිතට නැගුනු දේ ගැන යමක් ප්‍රකාශ කල හැකි ද?

ධ.බ: ඔක්තෝබර් 29 දා කලා උලෙල, දශක දෙකකට පසු සිංහල හා දෙමල කලාකරුවන් කොලඹට එකතු වූ අවස්ථාව යි. මෙම හමුව තුල සියලු ජනවර්ග නියෝජනය කෙරෙන කලාකරුවන් සිටියා. එයින් සමහරු පැමින සිටියේ යුද්ධයෙන් විනාශ වී ගිය උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලින්. ප්‍රහාරය සිදුවන මොහොතේ මම හිටියේ දේශන මේසය අසල. ක්ෂනිකව ම මගේ මතකයට නැගුනේ බිඳුනුවැව සංහාරය. හරියටම වසර තුනකට පෙරාතුව, 2000 ඔක්තෝබරයෙදි, බිඳුනුවැව පුනරුත්ථාපන කඳවුරේ සිටි ආයුධ රහිත දෙමල රැඳවියන් 27 දෙනෙකු එම ස්ථානයේ දී ම දරුනු ලෙස මරා දැමුවා. මෙය සිදුකලේ කඳවුරට කඩා වැදුනු සිංහල වර්ගවාදී නඩයක් විසින්. 1983 "කලු ජූලියේ" දී දෙමල ජනතාවට එරෙහිව පුලුල්ව ගෙන ගිය ජන සංහාරය ද මගේ සිහියට නැගුනා. නව නගර ශාලාවේ ප්‍රහාරයට සියලු ෆැසිස්ට් ලක්ෂන අන්තර්ගත වී තිබුනා.

*ලෝසවෙඅ:* මෙම මරන තර්ජනයන්ට, සුවිශේෂිතව ඔබ ඉලක්ක වී ඇත්තේ ඇයි?

ධ.බ: කෙටියෙන් කියනව නම්, වර්ගවාදී කොටස් මනාප නො වන ආකාරයෙන්, දෙමල විරෝධී යුද්ධයට එරෙහිව මා ගත් ආස්ථානය විය හැකියි. 1999 දී මගේ *ට්‍රෝජන් කාන්තාවෝ* නාට්‍යයේ මංගල දැක්මේ සාර්ථකත්වයෙන් පසු, දකුනේ නගර බොහොමයක එය වේදිකා ගත කලා. එය යුද-විරෝධී නාට්‍යයක් නිසා මම තීන්දු කලා, උතුරු-නැගෙනහිර පලාත්වලත් මෙය ප්‍රදර්ශනය කරන්න. මගේ පලමු තෝරා ගැනීම උනේ නැගෙනහිර පලාතේ ප්‍රධාන නගරය වන ත්‍රිකුනාමලය යි. 2001 දී මේ සඳහා ආරම්භක පියවර ගන්නවාත් සමග උතුරු-නැගෙනහිර හෝ දෙමල බහුතරයක් ජීවත්වන වතුකරයේ හෝ නාට්‍යය වේදිකා ගත නො කරන ලෙස තර්ජනය කරමින් පලමු ලිපිය ලැබුනා. එල්ටීටීඊයේ නමින් එම ලිපිය එවා තිබුනත් එය ඔවුන් කල දෙයක් යැයි මා විශ්වාස කලේ නෑ.

*ලෝසවෙඅ:* එම තර්ජන එල්ල කලේ එල්ටීටීඊය බවට ඔබ විශ්වාස නො කලේ ඇයි?

ධ.බ: ශතක ගනනාවකට පෙර, එදා ට්‍රෝයි නගරයේ වහල් භාවයට සහ වධබන්ධනයන්ට ලක් වූ ගැහැනුන් සහ අද දින යුද්ධයෙන් ඉරිතැලී ගිය කොසොවෝ කාශ්මීර් හෝ ශ්‍රී ලංකාවේ ගැහැනුන් අතර වෙනසක් මට නෑ. යුද්ධයෙන් වඩාත් පීඩා වින්දෙ උතුරු-නැගෙනහිර ප්‍රදේශය යි. *ට්‍රෝජන් කාන්තාවෝ* නාට්‍යයෙන්, රාජ්‍ය හමුදාවල ක්‍රියාකාරිත්වය හේතුවෙන් දුක් විඳින දෙමල ස්ත්‍රීන්ගේ දුක්ඛ දෝමනස්සයන් පිලිබිඹු වෙනවා. ඒ නිසා මම හිතුව, නාට්‍යයට එරෙහි තර්ජන දෙමල පාර්ශ්වයෙන් පැන නැගිය නො හැකි බව. මෙයින් අදහස් වෙන්නෙ නෑ, එල්ටීටීඊයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී මර්දන ක්‍රියාවන් මා විසින් නොතකා හරින බවක්. ඔබ දන්නා පරිදි, කයිට්ස් දූපතේ සමාජවාදී සමානතා පක්ෂ (සසප) සාමාජිකයන්ට එරෙහි එල්ටීටීඊ මරන තර්ජනයන් මවිසින් බලගතු ලෙස හෙලා දැක තිබෙනවා. කෙසේ නමුත් මා විශ්වාස කරන හැටියට මගේ යුද-විරෝධී නාට්‍යයට එරෙහිව මෙම මරන තර්ජන එල්ල කලේ සිංහල ස්වෝත්තමවාදී යුද වැද්දන් විසින්.

*ලෝසවෙඅ:* වත්මන් මරන තර්ජන සහ 1988 දී ඔබට එල්ල කල මරන තර්ජන අතර සම්බන්ධය කුමක් දැයි පැහැදිලි කල හැකි ද?

ධ.බ: 1988 දී, මම ෂෝන් පෝල් සාත්‍රෙගෙ *මෙන් විත් අවුට් ෂැඩෝස්* (*Men with out shadows*) හි සිංහල අනුවාදය වන *ධවල භීෂන* නිෂ්පාදනය කලා. එම කාලයේ දී කම්කරු පන්ති සටන්කාමීන්ට හා කම්කරු පන්ති සංවිධානවලට එරෙහිව ෆැසිස්ට් පන්නයේ ප්‍රහාරවල නිමග්නව සිටි ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), මගේ නාට්‍යයෙන්, තම නායක රෝහන විජේවීර අපහාසයට ලක් වෙතැයි චෝදනා කලා. දකුනු පලාතේ උප නාගරික ප්‍රදේශයක් වන තෙලිජ්ජවිල දී ධවල භීෂන වේදිකාගත කිරීමට නියමිතව තිබූ අවස්ථාවේ, ජවිපෙ ප්‍රාදේශීය නායකයකු විසින් එම දර්ශන අවලංගු කරන ලෙස බල කලා. ඔවුන් ඉන්දු-ලංකා සාම ගිවිසුමට එරෙහිව දෙමල-විරෝධී සහ ඉන්දියානු-විරෝධී ස්වෝත්තමවාදය අවුලවමින් සිටියේ. ජවිපෙ මරන තර්ජන හේතුවෙන් මට සැඟව සිටින්නට සිදු උනා. මම වර්ගවාදයටත්, යුද්ධයටත් සැම විටම වෛර කලා. මෙම අදහස් මත මහ ජනතාව උගන්වා ගැනීම සඳහා නාට්‍ය කලාව මාධ්‍යයක් ලෙස යොදා ගැනීමට මම උත්සාහ කලා. මේ නිසයි මම *ට්‍රෝජන් කාන්තාවෝ* නිර්මානය කලේ. මේ නාට්‍යය තෝරා ගනු ලැබුවේ අපේ රටේ සිවිල් යුද්ධය නිමා කොට, අපේ සමාජයට ස්ථිර සාමය ලබා දීමේ උත්සාහයන්ට මගේ ප්‍රතිපදානය ලෙස යි. සියවස් 25ක් ගත වී තිබිය දී පවා, එදා මෙදා තුර ලෝක රඟ මඬලේ, වඩාත්ම බලගතු හා ප්‍රමුඛ යුද-විරෝධී නාට්‍යය ලෙස *ට්‍රෝජන් කාන්තාවෝ* පවතිනවා. යුද්ධයට හා ම්ලේච්ඡත්වයට එරෙහි අරගලයේ දී. රංග භූමි ක්ෂේත්‍රය තුල කලාකරුවන් අත පවත්නා වඩාත්ම බලගතු ආයුධය මෙම නාට්‍යයයි. මං විශ්වාස කරනවා, මෙම යුද්ධය නිමා කිරීම සඳහා දරන උත්සාහයන්හි දී කලාකරුවකු ලෙස මට කල හැකි වඩාත්ම බලගතු සේවය මෙම නාට්‍යය වේදිකාගත කොට එහි විශ්වීය නාට්‍යමය පනිවුඩය භූමියේ

සෑම කොනකටම ගෙනයාම කියල.

*ලෝසවෙඅ:* යුද්ධය නිමා කිරීම සඳහා ආරම්භක දේශපාලන පියවරයන් කුමක් විය යුතු ද?

ධ.බ: උතුරෙන් හා නැගෙනහිරෙන් රාජ්‍ය හමුදාවන් වහාම ඉවත් කල යුතු යි. "උතුරෙන් හා නැගෙනහිරෙන් ශ්‍රී ලංකා හමුදා වහාම ඉවත් කරනු" යන සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) දිගු කාලීන උද්ඝෝෂනයට මෙහි දී මම පූර්න වසයෙන් එකඟ වෙනව. කයිට්ස් දූපතේ දී සසපට එල්ටීටීඊයෙන් එල්ල වූ ප්‍රහාරයේ දී එයට එරෙහිව මා නිකුත් කල ප්‍රකාශයේ, සසපයේ මෙම පිලිවෙත මම අවධාරනය කලා. උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි පැවැත්වූ නාට්‍ය වැඩමුලුවල දී ද, දකුනේ දී ද, මේ පිලිවෙත සම්බන්ධයෙන් මා ප්‍රසිද්ධියේ කතා කරල තිබෙනව.

*ලෝසවෙඅ:* වත්මන් "සාම ක්‍රියාදාමය" පිලිබඳ ඔබේ අදහස කුමක් ද?

ධ.බ: සාමය උදාකර දීම සඳහා යැයි කියමින්, ආන්ඩු කීපයක් විවිධ අවස්ථාවල දී විවිධ පියවරයන් ගත්තා. මේ සෑම අවස්ථාවක ම සාමය සඳහා යම් යම් දේ කිරීමට අපි උත්සාහ කලා. 1987 දී, ධර්මසේන පතිරාජ. වසන්ත ඔබේසේකර සහ ප්‍රසන්න විතානගේ වැනි කලාකරුවන් සමග එකතුව යුද්ධයෙන් ඉරිතැලුනු ප්‍රදේශයන්හි ජන ජීවිතය පිලිබඳ වාර්තාමය වීඩියෝ නිෂ්පාදන කීපයක් කලා. මින් සමහරක් රාජ්‍ය රූපවාහිනි සේවය වාරනය කල නමුත් එවැනි වාරනයකට ලක් වු මගේ *යුද්ධයේ දෝංකාරය* (*Echo of War*) නම් වීඩියෝ චිත්‍රපටය ඉන්දියානු දූර්දර්ශන් සේවය ඇතුලු ජාත්‍යන්තර රූපවාහිනි ජාල කීපයක විකාශය කලා. කෙසේ වුනත් ඉන් ඔබ්බට යමක් කිරීමට අපට නො හැකි වුනා.

ඒත් මෙවර සටන් විරාම ගිවිසුම නිසා අපට දෙමල කලාකරුවන් වෙත ලඟා විය හැකි වුනා. අපි යාපනයේ දී සිංහල, දෙමල කලා උලෙලක් පැවැත්වුවා. ඊට පස්සෙ තමයි කොලඹ උලෙල පැවැත්වුනෙ. ඔබට සත්‍ය පවසනවානම්, මට දැන් පෙනෙනවා මේ වත්මන් සාමය විවිධ සමාජ ස්ථරවලට බලපාල තිබෙන්නෙ විවිධ ආකාරයට කියල. මහා ව්‍යාපාරිකයන්ට මෙය තමාගේ ලාභ පොට්ටනි තර කර ගැනීමේ අවස්ථාවක් වන අතර, මේ සාමය නිසා කම්කරුවන්ගේ සහ සාමාන්‍ය මහජනතාවගේ දුක්ඛිතභාවය වැඩිවෙලා. ඇත්තවසයෙන් ම අපේ සාකච්ඡා කව තුල මෙවැනි පැහැදිලි සහ නිරවද්‍ය විශ්ලේෂනයක් සිදු නො වුනු බව පැවැසිය යුතුයි.

*ලෝසවෙඅ:* එල්ටීටීඊය පිලිබඳ ඔබේ අදහස කුමක් ද?

ධ.බ: එල්ටීටීඊ පාලනයක් තුල, එවැන්නක් ඇති වුවහොත්, යමෙකුට බලපොරොත්තු විය හැක්කේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ආඥාදායකත්වයක්. එවැනි පරිපාලනයක් කලාවට හෝ සමාජ ප්‍රගතියේ අන් කවර ක්ෂේත්‍රයකට හෝ ශුභදායක වෙන්නේ නෑ. උතුරු-නැගෙනහිර දෙමල කතා කරන කලාකරුවන් හා බුද්ධිමතුන් සමග මේ සම්බන්ධයෙන් මම සාකච්ඡා කරල තිබෙනවා. එම ප්‍රදේශයන්හි ජීවත්වන කලාකරුවන්, ඔවුන්ගේ ආත්ම ආරක්ෂාව තකා එල්ටීටීඊය විවෘතව විවේචනය නොකලත් ඔවුනගේ නිර්මාන මගින් සහ ක්‍රියාකාරකම් මගින් ප්‍රකාශයට පත් වන්නෙ එල්ටීටීඊයේ ජාතිකවාදී වැඩපිලිවෙලට ඔවුනගේ ඇති විරුද්ධත්වය යි. කලාවේ අභ්‍යන්තර නියාමයන් මගින්මත් ඉල්ලා සිටින්නේ, කලාවේ සංවර්ධනය සහ යහපත සඳහා සමස්ත මානවයාගේ, සහ ඔවුනගේ සංස්කෘතික ජයග්‍රහනයන්ගේ ඒකාග්‍රතාවය යි. මේ අනුව, ජාතික බෙදීම මගින් ස්වාභාවිකව ම කලාව මත ඇති කරන්නේ නිශේධනීය බලපෑම්.

*ලෝසවෙඅ:* ඔබේ ම අත්දැකීම් මගින් පැහැදිලි වන්නේ, තමාගේ ම නීති සහ පරිපාලනයන් යටතේ එකිනෙකින් වෙන්ව පවත්නා ජාතික රාජ්‍ය පද්ධතිය කලාවේ අභිවර්ධනය සඳහා බාධකයක් ලෙස පවත්නා බවයි. මේ බාධකය ජය ගන්නේ කෙසේ ද?

ධ.බ: නිර්මානාත්මක කලාකරුවෙකුට ගැඹුරු සහ ස්ථිර දේශපාලන අවබෝධයක් අත්‍යවශ්‍ය ම බව මම වටහා ගෙන තිබෙනවා. මේ සඳහා දැනටමත් මම *ලෝසවෙඅ* කියවනවා. මගේ අදහස අනුව, *ලෝසවෙඅ*, ජාත්‍යන්තරවාදී දේශපාලන අවබෝධය සඳහා පවත්නා හොඳම මූලාශ්‍රය යි. මේ සඳහා හොඳම උදාහරනයක් නම් අප මුහුන දී සිටින වත්මන් දේශපාලන අර්බුදය පිලිබඳව සසප ප්‍රකාශනය සහ "ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාදාමයේ දේශපාලන ආර්ථිකය" නමින් නික් බීම්ස් විසින් ලියන ලද කොටස් දෙකකින් යුත් ලිපිය යි. මගේ සමහර දෙමල කතා කරන කලාකරුවන් තුල කොලඹ පාලක ප්‍රභූව තුල ඇති වී තිබෙන වත්මන් අර්බුදය පිලිබඳව තිබුනෙ ව්‍යාකුලත්වයක්. මේ ව්‍යාකුලත්වයෙන් ගොඩ ඒම සඳහා අමුද්‍රව්‍ය සොයමින් ඔවුන් සිටියෙ. මම ඔවුනට *ලෝසවෙඅ* ලිපි ලේඛන තැපැල් කලා.

© www.wsws.org